# 3RD MATARA - RAHULA SCOUT TROOP

## OLD SCOUT SOCIETY

**RAHULA COLLEGE – MATARA TEL +94-41-2222749**

**HON. COUNSELLOR**

KITHSIRI LIYANAGAMAGE

(Principal – Rahula College)

**HON. PRESIDENT**

DR.SANJAYA SEDARA SENARATH

Mob. +94-773077667

**HON. SECRETARY**

MR.G.A.SANJAYA KUMARA

Res. +94-414910490, Mob. +94-775698994

**HON. TREASURER**

MR. M.M.K. PREMAKUMARA

Res. +94-602426201, Mob. +94-772946085

**HON. VICE PRESIDENT**

MR.P.D. SAMARAWEERA

Res.+94-602415858, Mob. +94-777594849

**HON. VICE SECRETARY**

MR.SUNIL MOHOTTI

Mob. +94-773712954

**HON. CHIEF CONVENERS**

MR.P.VIMALAGUNASEKARA

Res. +94-412240329 ,Mob.+94-718371847

MR. R.A.SALITH LASANTHA

Mob.+94-718265150

**COMMITTEE MEMBERS**

Dr. Piyal Perera Mob.+94-777900485

MR. K.G.A.H.C. Senadeera

Mob.+94-714484644

MR. Buddhika Pathirana

Mob.+94-77306922

MR. Amila Rubasinghe

Mob.+94-716483437

MR. Lasantha Prasad

Res..+94-412228928

MR. Kolitha Weerasinghe

Mob.+94-773868915

MR. Chalitha A. Gunawardena

Mob.+94-718408184

MR. Sumudu Weerawansa

Mob.+94-415680032

MR. Ivan Premathilaka

**ACCOUNTANTS**

MR. KAPILA S. LIYANAGE

Mob.+94-777905088

MR. KAVEESHA KARUNARATHNA

Mob +94-773586505





1991 **කඹුරුපිටිය ගම්උදාව භූමියෙහි සිතියමේ කොටසක්**

**මාතර රාහුල විද්‍යාලයයීය ආදි බාලදක්ෂ සංසදය,**
**රාහුල විද්‍යාලය,**
**මාතර.**

2009.06.08

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති,**
**ත්‍රී සිංහලාධීශ්වර විශ්වකීර්ති ශ්‍රී අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා,**
**ජනාධිපති ලේකම් කාර්යාලය,**
**කොළඹ** 01.

**විදුහල්පති තුමා / රාහුල විද්‍යාලය- මාතර මගින් ,**

**<u>කඹුරුපිටිය ගම්උදාව භූමිය පිහිටි තාකන්දපුර රජයේ ඉඩමෙහි කොටසක් මාතර රාහුල විද්‍යාලයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කරනු ලබන ඉල්ලීම</u>**

**1991 ගම්උදාව භූමිය පිහිටි අක්කර 108 ක භූමියෙහි දැනට රුහුණ විශ්ව විද්‍යාලයට පවරා දී ඇති අක්කර 71 සහ රුහුණුගම - රජයේ රෝහල**

පිහිටා ඇති කොටසට අමතරව තවත් එම අක්කර 108 ක භූමිය තුළ දැනට වල් බිහි වී ගිය රජයේ ඉඩම් පවතින අතර එක් එක් කොටස්, නිවාස / නාගරික සංවර්ධන අධිකාරිය සහ රජයේ ඉංජිනේරු සංස්ථාවට අයත්ව පවතී. මෙයින් ඉහත සැලැස්මට අනුව, සොයා ගන්නා ලද තොරතුරු අනුව 1459 දරන රජයේ සැලැස්ම අනුව 1992.07.18 දින නාගරික සංවර්ධන අධිකාරියේ මිනින්දෝරු අධිකාරී K.P. චන්ද්‍රසේකර මහත්මා විසින් මැන කැබලි කර සකස් කරන ලද මුළු සැලැස්මේ ප්‍රකාර කැබලි අංක 08 තවමත් නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතී. තවද එම කැබල්ල යම් රාජ්‍ය ආයතනයකට හෝ රුහුණ විශ්ව විද්‍යාලයට ලබාදීමට නාගරික සංවර්ධන අධිකාරියේ කැමැත්තක් ඇති බවද දැන ගැනීමට අපට හැකිවිය. මන්ද එම භූමි කොටස තුළ ඇතැම් පුද්ගලයන් අනවසරයෙන් වගාවන් පවත්වාගෙන යන බැවිනි. තවද 1991 ගම්උදාව පිහිටි අක්කර 108 ක භූමියෙහි ඇතැම් ස්ථාන බලහත්කාරයෙන් අත්පත් කර ගැනීමට තැත් කිරීම් ගැනද විටින් විට අපට අසන්නට ලැබී ඇත.

මෙම කොටස් රාහුල ආදි බාලදක්ෂ සංසදයේ නිලධාරීන් වශයෙන් අප නිරීක්ෂණය කරන ලද අතර, මාතර රාහුල විද්‍යාලයට මෙම කොටස / කොටස් ඔබතුමාගේ නිර්දේශයකින් නීත්‍යානුකූල ලෙස අත්පත් කර ගැනීම තුළින් අප " 3 වන මාතර " බාලදක්ෂ සමූහයේ (3rd Matara – Rahula Scout Troop) ප්‍රායෝගික බාලදක්ෂ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කර ශ්‍රී ලංකාව පුරාම විහිදී සිටින බාලදක්ෂයින්ට අවශ්‍ය ප්‍රායෝගික පුහුණුව සැලසීමට හැකිවෙන පරිදි කඳවුරු භූමියක් ස්ථාපනය කිරීමට හැකි බව පෙනුනි. එබැවින් 1991 **කඹුරුපිටිය ගම්උදාව භූමිය පිහිටි නාකන්දපුර රජයේ ඉඩමෙහි කොටසක් මාතර රාහුල විද්‍යාලයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු ඔබ තුමා මාර්ගයෙන් සලසා ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.**

ඒ අනුව අපගේ කටයුත්තට ඉතාම උචිත පරිසරය සහ ලබාගැනීමට අවශ්‍ය යැයි අප සිතන භූමි කොටස් ඉහත සැලැස්මට අදාලව අංක 08 සහ 12 යැයි සිතන කොටස් බව කිව හැක. එම කොටස් සහ තවත් ප්‍රධාන පාරට ආසන්නයේ ඇති අත්පත් කර ගත හැකි අක්කර 05 ක් පමණ වෙතොත් මාතර රාහුල විද්‍යාලයට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙන් අත්පත් කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉතා ඕනෑකමින් අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

<u>මෙය ලබා ගැනීමෙහි ඇති වැදගත්කම ලෙස අප දකින ප්‍රධාන කාරණා කිහිපයකි</u>

1 අවට පරිසරයෙහි චමත්කාරය.

2 යටිතල පහසුකම් යම්තාක් දුරට පැවතීම.

3 යාබදව රජයේ රෝහලක් පැවතීම නිසා කඳවුරු බඳින පාසැල් සිසුන් හට සහ එහි විවිධ පුහුණු කටයුතු වලට සහභාගි වන පුද්ගලයින්ට සෞඛ්‍ය පහසුකම් ලබා දීමට ඇති හැකියාව.

4 ඉඩම වටා ඇති ආරක්ෂිත වැට සහ ආරක්ෂක ස්ථානයක් වීම.

5. රුහුණ විශ්වවිද්‍යාලයේ භූමිය ඊට යාබදව ඇති නිසා ජාතික හෝ අන්තර්ජාතික මට්ටමේ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේදී පාලක සභාවේ අවසරයක් ලබාගෙන අවශ්‍ය අවස්ථාවකදී එම භූමිය වුවද ප්‍රයෝජනයට ලබා ගැනීමට ඇති හැකියාව අප විදුහලට සම්බන්ධකම් ඇති මහාචාර්යවරුන් සමග අප කළ කථා බහේදී පෙන්වා දීම.

6. වැඩසටහන් වලදී විශ්වවිද්‍යාල අචාර්යවරුන්ගේ දායකත්වය ලබා ගැනීමට ඇති හැකියාව

තවද දැනට වල් බිහි වී ගිය සහ අතහැර දමා ඇති <u>**ගරා වැටී ඇති ගොඩනැගිලි දෙකක් සහිත**</u> වැසිකිළි සහ කුඩා ජල ටැංකියක් සහිත අංක 12 ඉඩම් කොටසද දැනට ලබාදී ඇති ආයතනයෙන් ලබාගෙන මාතර රාහුල විද්‍යාලයට අත්පත් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉතා ඕනෑකමින් අපි ඉල්ලා සිටිමු.

ගම්උදාව සැලැස්මට අනුව මෙම (1992.07.18 දින නාගරික සංවර්ධන අධිකාරියේ මිනින්දෝරු අධිකාරී K.P. චන්ද්‍රසේකර මහත්මා විසින් මැන කැබලි කර සකස් කරන ලද මුළු සැලැස්මේ ප්‍රකාර කැබලි අංක අංක12 භූමි කොටස කා හට පවරා ඇත්දැයි අප හට සොයා ගැනීමට අපහසු විය.) ඉඩම් කොටසෙහි ගොඩනැගිලි Site Office සහ Police ලෙස නම් කර ඇත.

එමෙන්ම මෙම භූමිය / භූමි කොටස් අත්පත් කරගැනීම මගින් මාතර රාහුල විද්‍යාලයීය ආදි බාලදක්ෂ සංසදය සමාජයට ඉතාමත්ම වැඩදායී සංවර්ධන කටයුතු ඉටුකිරීම මනා කළමනාකාරීත්වයක් යටතේ සිදුකිරීමට අදහස් කරන බවද තවදුරටත් දැන්වීමට අපි කැමැත්තෙමු.

මෙයට,
විශ්වාසී,

**අත්සන් කළේ රාහුල විද්‍යාලයීය ආදි බාලදක්ෂ සංසදය ව්‍යවස්ථානුකූල නිලධාරී මණ්ඩලය - 2009 වෙනුවෙන්,**

සභාපති - **වෛද්‍ය සංජය සේදර සෙනරත් මයා** ..................................

ලේකම් - **G.A. සංජය කුමාර මයා** ..........................

භාන්ඩාගාරික - **M.M. කපිල ප්‍රේමකුමාර මයා** .........................

උප සභාපති - **පදමකුමාර ඩී. සමරවීර මයා** ..................................

පිටපත් :-

1. **ලේකම් රාහුල ආදි ශිෂ්‍ය සංගමය - මවු ශාඛාව** ( අවශ්‍ය කටයුතුවලට මැදිහත් වීම සඳහා )
2. **සභාපති රාහුල ආදි ශිෂ්‍ය සංගමය - මවු ශාඛාව** ( අවශ්‍ය කටයුතුවලට මැදිහත් වීම සඳහා )
3. **ලේකම් රාහුල ආදි ශිෂ්‍ය සංගමය - කොළඹ ශාඛාව** ( අවශ්‍ය කටයුතුවලට මැදිහත් වීම සඳහා )
4. **සභාපති රාහුල ආදි ශිෂ්‍ය සංගමය - කොළඹ ශාඛාව** ( අවශ්‍ය කටයුතුවලට මැදිහත් වීම සඳහා )